EXAMRESULTS.LK

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 07 - 2023

# ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

උපදෙස්:-

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වරහන් තුලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

1. අතීත සත්ත්ව පාලන කටයුතුවලදී ගවයින් රැක බලාගත් පුද්ගලයා ............................................................ ලෙස හැඳින්වී ය.
2. ලෝහ කර්මාන්තයේ යෙදුණු ශිල්පීන් අතීතයේ දී ..................................................................... ලෙසින් හඳුන්වා ඇත.
3. පැරැන්නන් භාවිතා කළ .....................................................නම් කාසි විශේෂය, මෙරට භාවිත වූ පැරණිතම කාසි වර්ගය යි.
4. පල්ලව පාලකයින් .................................................. අගනගරය කර ගනිමින් රාජ්‍ය පාලන කටයුතු පවත්වා ගෙන යන ලදි.
5. තෝපා වැව හා දුඹුටුලු වැව ඒකාබද්ධ කර .................................................................... ඉදිකර තිබේ.

(කහාපණ / රිදී කාසි / ගොපල්ලා / පරාක්‍රම සමුද්‍රය / ලෝකුරු / කලා වැව / තඹකර / කාංචිපුරය)

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.**

6. ධාතුසේන රජු ලම්භකර්ණ රාජ වංශයට අයත් පාලකයෙකි. ( )
7. අනුරාධපුර යුගයේ අවසාන කාලයේ ගම් පාලනය කළ පුද්ගලයින් ''ගම් ලද්දන්'' ලෙස හැඳින්විය. ( )
8. ගාලු කොටුව පෘතුගීසින් විසින් ඉදිකරවන ලද නිර්මාණයකි. ( )
9. තෛපොංගල් යනු ඉස්ලාම් ආගමික ජනතාව විසින් සමරනු ලබන උත්සවයකි. ( )
10. අම්බලන්ගොඩ ප්‍රදේශය වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධය. ( )

- **අංක 11 -15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

11. මානවම්ම කුමරු ආරක්ෂාව පතා පලා ගිය රාජ්‍යය කුමක් ද?
i. පාණ්ඩ්‍ය ii. පල්ලව iii. කාලිංග iv. චෝල

12. පණ්ඩුකාභය රජුගෙන් පසු රාජ්‍ය උරුමය හිමි වූයේ,
i. සද්ධාතිස්ස කුමරුට ය. ii. දේවානම්පියතිස්ස රජුට ය. iii. කාවන්තිස්ස රජුට ය. iv. මුටසීව රජුට ය.

13. ලෝක සංස්කෘතික උරුමයක් බවට පත් මොහෙන්දජාරෝ නගරය පිහිටි රට කුමක් ද?
i. බංග්ලාදේශය ii. පකිස්තානය iii. චීනය iv. ඊජිප්තුව

14. හින්දු ආගමික පොත් පත්වල'ජාත කර්ම' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
i. නම් තැබීම ය. ii. කන් විදීම ය. iii. උපතේදී කරන සිරිත් ය. iv. ඉඳුල් කට ගෑම ය.

15. පනාකඩුව තඹ සන්නස රචනා කරවන ලද්දේ,
i. පරාක්‍රමබාහු රජු ය. ii. I වෙනි විජයබාහු රජු ය. iii. පස්වන මිහිඳු රජු ය. iv. වසභ රජු ය.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර හිස්තැනෙහි ලියන්න.**

16. පැරණි පරාක්‍රමපුරය වර්තමානයේ දී ............................................ නමින් හැඳින් වේ.

17. වරායවලට පැමිණෙන නැව්වලින් බදු එකතු කිරීම ............................................ නිලධාරීන්ට අයත් කාර්යයක් විය.

18. ශ්‍රී ලංකාවට අයත් තට්ටු හා පඩි පේළිවලින් යුක්ත ශක්තිමත් නැව් තම වරායවල තිබූ බව ............................................ මූලාශ්‍රයවල සඳහන් වේ.

19. ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීම සඳහා .................................. රජු විසින් සෑම ගම් දහයකට ම එක් වෛද්‍යවරයකු බැගින් පත්කර ඇත.

20. පරාක්‍රමබාහු රජුගේ උපත සිදු වූ ස්ථානය සිහිකිරීම සඳහා ......................................දාගැබ ඉදිකර ඇත.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

**1.** පහත සඳහන් පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



(අ) i. **A** පින්තූරයේ දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?


ii. එය ඉදි කළ රජතුමා කවුරුන් ද?

iii. එය පිහිටා ඇති රාජධානිය කුමක් ද? (ලකුණු 3)

(ආ) i. **B** පින්තූරයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

ii. එය කුමන රජු විසින් කරවන ලද්දක් ද?


iii. මෙහි ඇති ලේඛණවල සඳහන් තොරතුරුවලට අනුව දිනපතා වැයවන මුදල් සටහන් කළයුතු පොත කුමක් ද? (ලකුණු 3)




(ඇ) i. දී ඇති ලංකා සිතියමේ **A** අක්ෂරයෙන් දක්වා ඇති වරාය කුමක් ද?

ii. **B** අක්ෂරයෙන් දක්වා ඇති වරාය අතීතයේ හැඳින්වූ නම කුමක් ද?

iii. කාශ්‍යප රජු ඉදිකළ රාජධානිය සිතියමේ **C** අක්ෂරයෙන් දැක්වේ. එය හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 3)




(ඈ) i. දී ඇති ලෝක සිතියම් කොටසෙහි **චීනය** දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. භාතිකාභය රජතුමා දූතයන් යවා වීදුරු පබළු ගෙන්වා ගත් රාජ්‍ය **B** අක්ෂරයෙන් දැක්වේ. එය හඳුනාගෙන නම් කරන්න.

iii. අරාබිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 03)

(ඉ) විදේශ රටවලින් ලංකාවට ගෙන එන ලද භාණ්ඩ හතරක් නම් කරන්න. (ලකුණු 04)

**2.** i. අනුරාධපුර යුගයේ දී රාජ්‍ය පාලනය සඳහා රජුට සහය වූ නිලධාරීන් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

ii. ජනතා සුභසිද්ධිය සඳහා රෝහල් ඉදිකළ රජවරු තුන් දෙනෙකු නම් කරන්න. (ලකුණු 3)

iii. විජයබාහු රජුගෙන් සිදු වූ ආගමික සේවාවන් හතරක් නම් කරන්න. (ලකුණු 4)

**3.** i. ලංකාවට බලපෑම් එල්ලකළ දකුණු ඉන්දියානු රාජ්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. පරාක්‍රමබාහු රජු විසින් වගාවට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා දැදුරු ඔය හරස් කර ඉදිකරන ලද අමුණු තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii.

**A.** නිශ්ශංකමල්ල රජු පොළොන්නරුවේ රජවීමේ දී මුහුණදුන් අභියෝග දෙකක් නම් කරන්න.

**B.** එතුමා එම අභියෝග ජය ගැනීම සඳහා ගත් ක්‍රියා මාර්ග තුනක් ලියන්න. (ලකුණු 5)

**4.** i. හෝපිටිගම වෙළෙඳපොළ පාලනය සම්බන්ධයෙන් බදුලු ටැම් ලිපියේ සඳහන් නීති තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. ශ්‍රී ලංකාව වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ පිළිතුර ලියන්න.

**A** අශෝකමාලා රසවත් ආහාර පිසූ බව සඳහන් ග්‍රන්ථය කුමක් ද?

**B** පැරණි මූලාශ්‍රයවල සූපශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් හැඳින්වූ නම ලියන්න.

**C** දියණිවරු සූප ශාස්ත්‍රයේ දක්ෂයන් කිරීම දෙමාපියන්ගේ වගකීමක් බව සඳහන් ග්‍රන්ථය නම් කරන්න.

**D** අටවන අග්ගබෝධි රජු තම මවට සැළකූ ආකාරය පිළිබඳ තොරතුරු සඳහන් ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 4)

**5.** i. අනුරාධපුර රාජධානියේ පාලන කටයුතු මෙහෙය වූ රාජ වංශ තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. අනුරාධපුර යුගයේ පාලකයන් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී විශේෂ සැලකිල්ලක් දැක්වූ කරුණු හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. අනුරාධපුර යුගයේ දී රාජ්‍ය උරුමය හිමි වූ ප්‍රධාන ආකාර දෙක නම් කර ඊට ඉදිරියෙන් ඒ සඳහා උදාහරණය බැගින් ලියා දක්වන්න. (ලකුණු 4)

**6.** i. අපේ රටේ දක්නට ඇති අස්පෘශ්‍ය උරුම තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ලෙස පිළිගෙන ඇති ලංකාවේ පිහිටි ස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. අතීත ශ්‍රී ලංකාවේ පැවති සාම්ප්‍රදායික කර්මාන්ත 4 ක් නම් කරන්න. (ලකුණු 4)


**7.** • **පහත සඳහන් උපකාරක පද යොදා ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.**

**හරහට**

1. පඬුයා මේ නමින් ද හඳුන්වයි.
2. අලුතෙන් ගිනිතබා සකස්කරගත් හේන
3. මහා පැරකුම් රජතුමා විසින් ඉදිකර වූ ආගමික ගොඩනැගිල්ලකි
4. කම්මල් කර්මාන්තයේ දී භාවිත වන උපකරණයකි
5. ඈපා හඳුන්වන වෙනත් නමකි

**පහලට**

1. බෝග වගාකරන කාලය මෙසේ හැඳින්වේ
2. යුධ ආධාර ඉල්ලා ලංකාවට පැමිණි පාණ්ඩ්‍ය කුමාරයෙකි
3. මානාභරණ රජුගේ පාලන මධ්‍යස්ථානය
4. පොළොන්නරු රාජධානියේ පළමු ...
5. දෙවන දප්පුල රජුගේ පුත්‍රයෙකි
6. පැරණි ජනයා කෘෂි උපකරණ තනා ගැනීමට යොදා ගත් දෙයකි




(ලකුණු 11)

PAST PAPERS WIKI
(4) WWW.PastPapers.WiKi (4)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## ඉතිහාසය

පිළිතුරු පත්‍රය

### I කොටස

01. ගොපල්ලා
02. ලෝකුරු
03. කහාපණ
04. කාංචිපුරය
05. පරාක්‍රම සමුද්‍රය
06. ( ✗ )
07. ( ✓ )
08. ( ✓ )
09. ( ✗ )
10. ( ✓ )
11. පල්ලව (ii)
12. මුටසීව රජු (iv)
13. පකිස්තානය (iii)
14. උපතේදී සිදු කරන සිරිත් (iii)
15. I විජයබාහු රජු (ii)
16. පඬුවස්නුවර
17. රේගු
18. චීන
19. බුද්ධදාස රජු
20. සූතිඝර / දැදිගම කොටවෙහෙර

### II කොටස

**1.**

(අ) i. පරාක්‍රමබාහු මාලිගය / වෛජයන්ත ප්‍රාසාදය
ii. මහා පරාක්‍රමබාහු රජු / I වෙනි පරාක්‍රමබාහු රජු
iii. පොළොන්නරුව

(ආ) i. මිහින්තලා පුවරු ලිපිය
ii. 4 වන මිහිඳු රජු
iii. පඤ්චිකාපොත / පාස්පොත

(ඇ) i. ගෝකණ්ණ වරාය / ත්‍රිකුණාමල වරාය
ii. මාතොට / මහාතිත්ත
iii. සීගිරිය

(ඈ) i. A
ii. B
iii. C

(ඉ) පිගන් භාණ්ඩ, සුවඳ විලවුන්, අශ්වයන්, සේද රෙදි, ආභරණ

**2.** i. යුවරජ, සේනාපති, භාණ්ඩාගාරික, මහා ලේඛක, අදෙක, අසදෙක, අතිඅධික

ii. බුද්ධදාස රජු, I උපතිස්ස රජු, I උදය රජු, IV කස්සප රජු

iii.
- ★ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් වැඩම කිරීම
- ★ ශ්‍රී පාදයට යන මාර්ගය ඉදිකිරීම
- ★ දළදා මාලිගයක් ඉදිකිරීම
- ★ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම

**3.** i. පල්ලව, පාණ්ඩ්‍ය, චෝල

ii. කොට්ඨ බද්ධ, සූකර නිජ්ඣර, දෝරදක්තික

iii. A. 1. කාලිංග වංශිකයකු වීම.

2. පරාක්‍රමබාහු රජුගේ දක්ෂ සේනාපතිවරුන් අවනත කර ගැනීම.

3. පාණ්ඩ්‍ය වංශිකයන් බලවත් වීම වලක්වා ගැනීම.

4. රුහුණේ තම බලය පවත්වා ගැනීම.

B. ★ ආගමික හා සුභ සාධක කටයුතු සිදු කිරීම ★ දිලින්දන්ට සැලකීම

★ තුලාභාර දානය දීම ★ බදුසහන ලබා දීම

**4.** i. ★ අනුමත තරාදි පඩි භාවිතා කල යුතුයි. ★ වෙළඳ පල පසුකර යන්නන්ගෙන් බදු අය නොකල යුතුය.

★ බුලත් පුවක් මඩුවක තබා විකිණිය යුතුය. ★ පෙර මගට ගොස් බඩු නොගත යුතුය.

ii. චීනය, අරාබිය, පර්සියාව, රෝමය, අග්නිදිග ආසියාතික රටවල්

iii. A සද්ධර්මලංකාරය C සහස්සවත් ථූපකරණයේ

B මදූපාවිකා D මහාවංශය

**5.** i. මෞර්ය වංශය, ලම්බකර්ණ වංශය, මානවම්ම පෙලපත

ii. ★ රටේ ආරක්ෂාව සැලසීම. ★ ආර්ථික ශුභ සිද්ධිය ඇති කිරීම.

★ නීතිය හා සාමය පවත්වා ගැනීම ★ ශාසනික අභිවෘද්ධිය ඇති කිරීම.

iii. ★ පියාගෙන් පුතාට - කාවන්තිස්ස රජුගෙන් දුටුගැමුණු රජුට වැනි ...

★ සහෝදරයාගෙන් සහෝදරයාට - දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස කුමරාට වැනි ...

**6.** i. ජන වහර, රංග කලාව, ජන කවි, සංගීත, ඇදහිලි, විශ්වාස, උත්සව, කලා ශිල්ප වැනි ...

ii. ගාලු කොටුව, දළදා මාලිගය, සීගිරිය, අනුරාධපුර නගරය

iii. පිත්තල කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය, පන් කර්මාන්තය, වෙස් මුහුණු, වඩු කර්මාන්තය, මැණික්, රූ කඩ

**7.**

| **හරහට** | **පහලට** |
|---|---|
| 1. හැලිකටා | 1. කන්න |
| 2. නවදැලිහේන | 2. වරගුණවර්මන් |
| 3. පොත්ගුල් විහාරය | 3. දැදිගම |
| 4. මයිනහම | 4. විජයබාහු |
| 5. ආදිපාද | 5. සේන |
| | 6. යකඩ |